# ශ්‍රී ලංකාවේ

# අධ්‍යාපනය නැවත පරිකල්පනය කිරීම





ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ
ජනාධිපති කාර්ය සාධක බලකාය



අගෝස්තු 2020

# සෞභාග්‍යයේ දැක්ම



ගෝඨාභය රාජපක්ෂ
*ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා*

"ප්‍රඥාසම්පන්න පුරවැසියෙක් : දැනුමෙන් පිරිපුන් සමාජයක - පෙරපාසැල් අධ්‍යාපනයේ සිට උපාධිය දක්වා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ව සැකසෙන නිශ්චිත අරමුණක් සහිත තනි විෂය නිර්දේශයක් (Single Curriculum) යටතේ සෑම දරුවෙකුටම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහිත ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පුළුල් ප්‍රතිසංස්කරණයක් ඇති කෙරේ. ඒ ඔස්සේ සෑම දරුවෙකුටම තම සහජ කුසලතා ඔප්නංවා ගැනීමේ සහ රැකියා වෙළෙඳපොළට ගැළපෙන අධ්‍යාපනයක් වෙත යොමුවීමට ඇති අවස්ථාව පුළුල් කෙරේ."

"තරුණ තරුණියන්ට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අතරමං වීමට සිදු නොවන පරිදි පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක් ම පැහැදිලි මාර්ග සැලැස්මක සකස් කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ඇත."

"ඒ තුළ තාක්ෂණික අධ්‍යාපන අවස්ථා ප්‍රසාරණය කිරීම මෙන් ම අධ්‍යාපන ක්‍රියාවලිය තුළ තාක්ෂණය භාවිතය පුළුල් කිරීමටත් අපි බලාපොරොත්තු වෙමු."

# පටුන


| | |
|---|---|
| සෞභාග්‍යයේ දැක්ම | |
| හැඳින්වීම | 01 |
| අග්‍රගණ්‍ය ඉලක්ක | 03 |
| සියලු අංශ සඳහා නිර්දේශ | 05 |
| නිශ්චිත අංශ සඳහා නිර්දේශ | 10 |
| සාමාන්‍ය අධ්‍යාපනය | 12 |
| තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව | 14 |
| උසස් සහ වෘත්තීය අධ්‍යාපනය | 15 |
| භෙද අධ්‍යාපන අංශය | 17 |

# හැඳින්වීම

ක්‍රි:පූ හයවන (6) සියවසේ සිට ශ්‍රී ලංකාවේ අතිශය සාරවත්වූ ඉගෙනුම් සංස්කෘතියකින් පිරිපුන් දේශයක් පැවති බව ආසියාව පුරා දැනුම සොයා දේශාටනයේ යෙදුනු ගවේශකයින්ගේ තොරතුරු වලින් තහවුරු වේ. ගිහි පැවිදි ශිෂ්‍යයින්ට ථෙරවාද බුදු දහම කේන්ද්‍රකරගත් දැනුමේ කලාපීය කේන්ද්‍රයක් ලෙස ශ්‍රී ලංකාව පැවති බව 'මහාවිහාරය' ආශ්‍රිත ලිඛිත ඉතිහාසය අධ්‍යයනයේදී මැනවින් තහවුරු වේ. එකී මුල් යුගයේදී අධයාපනනික මධ්‍යස්ථාන මගින් සාම්ප්‍රදායික අධ්‍යාපනයක් පමණක් නොව ආගමික, ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික මෙන්ම රෙදි විවීම, ගෘහ නිර්මාණ ශිල්පය, ජ්‍යාමිතිය, වාරිමාර්ග හා කෘෂිකර්මය ආදී පුළුල් පරාසයක දැනුමෙන් සාකල්‍ය වූ අධ්‍යාපනයක් මගින් පුද්ගල නිපුණතා හා හැකියා ඔප් නංවාලීමට සමත් පුරවැසියන් මෙරට මෙන්ම කලාපීය රටවල් වෙතද සලසා දීමට සමත්ව තිබීම විශේෂත්වයකි.

එමෙන්ම, මෙරට දීර්ඝ කාලයක් පුරා ක්‍රියාත්මකවූ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය හේතුවෙන් වර්තමානය වනවිටත්, ප්‍රාථමික අධ්‍යාපනයට සිසුන් ඇතුලත්වීමේ ලෝක දර්ශකයේ ඉහළ අනුපාතිකයක්ද, ප්‍රාථමික අධ්‍යාපනයේදී ස්ත්‍රී හා පුරුෂ පාර්ශව සඳහා සමාන අධ්‍යාපන ප්‍රවේශ මෙන්ම, 93%ක්වූ ඉහළ සාක්ෂරතාවක්ද, යනාදී වශයෙන් ජාතියක් ලෙස ආඩම්බර වියහැකි වැදගත් අධ්‍යාපනික දර්ශක රාශියක් කරා ළඟාවීමට හැකිවීමද කලාපීය වශයෙන් අප ලබාගත් ජයග්‍රහණයක් ලෙස දැක්විය හැක.

එහෙත්, ශ්‍රී ලංකාව කාලීනව අතිශය වැදගත්වූ සාකල්‍ය අධ්‍යාපනික ජයග්‍රහණ රාශියක් අහිමි කරගැනීමේ අවදානමකට මුහුණ දෙමින් සිටින බවද වටහා ගත යුතුව ඇත. තෘතියක අධ්‍යාපනය සඳහා ශ්‍රී ලංකා සිසුන්ගේ දළ ඇතුලත්වීමේ අනුපාතිකය, දකුණු ආසියාවේ සාමාන්‍යයටත් වඩා පහළ තත්ත්වයක ඇති බවද මෙම තත්ත්වය ශ්‍රී ලංකාව අයත්වන 'මැදි ආදායම්' කාණ්ඩයේ රටවල් අතරින් පහළම අගයක් ගන්නා රට ලෙස පසුබෑමට හේතුවක් වී ඇති බවද අකමැත්තෙන් වුවද පිළිගත යුතුව ඇත.

එමෙන්ම, වර්තමානය වනවිට ශ්‍රී ලංකාව දකුණු ආසියාව තුල ඉහළම බුද්ධිගලනය  සහිත රට බවට පත්ව ඇති අතර, දශක ගණනාවක සිට ක්‍රියාත්මක වූ නිදහස් අධ්‍යාපනයේ නිවැරදි නොවූ සමහර ප්‍රතිපත්තිවල අයහපත් ප්‍රතිඵලයක් ලෙස රජය විසින් සියළු උපාධිධාරීන් වෙත රැකියා සම්පාදනය කලයුතු බවට ස්ථාපිතව ඇති ඉතා අයහපත් ආකල්ප, ශ්‍රම වෙලඳපලේ අවශ්‍යතා සමග ලබාදුන් නිපුණතා නොගැලපීම, විභාග කේන්ද්‍රීය හා ගුරු කේන්ද්‍රීය ඇගයීම් ක්‍රම වල අයහපත් ප්‍රතිඵල ලෙස කටපාඩම්,අනම්‍ය විශයමාලා, දුර්වල පෞරුෂත්වය මෙන්ම අඩු සමාජ සවිඥානික පුරවැසි පද්ධතියක් නිර්මාණය වීමද, එමගින් ජාතීන් අතර  අසමගිය, සාරධර්ම වල පසුබෑම පසුකාලීනව වාර්ගික යුධමය තත්ත්වයක් කෙරෙහි මෙන්ම ආර්ථික අවපාතයක් කරා යොමුවී තිබීම කෙරෙහිද අපගේ දැඩි අවධානය යොමුවිය යුතුව ඇත.

සමාජයේ සියලූම පාර්ශවවල දැඩි පෙළඹවීම මත රජය විසින්, 2020-2030 නිපුණතා සංවර්ධන දශකය ලෙස ප්‍රකාශයට පත් කිරීමට සමගාමීව මෙරට අධ්‍යාපන පද්ධතිය කාලීන පරිවර්තනයකට ලක් කිරීම උදෙසා පරිපූර්ණ සැලැස්මක් සකස් කිරීම කාලීන අවශ්‍යතාවයකි. මෙයට සමගාමීව ඉදිරි වසර පහක කාලය අතුලත ශ්‍රී ලංකාව සිය තිරසර සංවර්ධන මාවතේ වේගවත් ඉදිරි පිම්මක් තැබීමට හැකිවනු පිණිස 21 වන සියවසට ගැලපෙන කුසලතා හා නිපුණතා වලින් අප තරුණ පරපුර සමන්විත කලයුතුව ඇත.

මෙම වසරේදී අපි මුහුණදුන් COVID-19 ගෝලීය වසංගතය හේතුවෙන් සියලූම අධ්‍යාපන ක්‍රමවේදයන් අඩාල විය. මේ හේතුවෙන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික ක්ෂේත්‍රය. පරිවර්තනීය වෙනසක් සඳහා මග පෑදිණි 'සෞභාග්‍ය දැක්ම' ජාතික තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ප්‍රවේශයේ දක්වා ඇති ඉලක්ක කරා දේශයේ මානව සම්පත පෙලගස්වනු පිනිස, පූර්ව ළමාවිය අධ්‍යාපනයේ සිට තෘතීය අධ්‍යාපනය දක්වා, ආසන්න වශයෙන් දශක දෙකක පමණ ගමන්මග සම්පූර්ණ කිරීම සඳහා සැමට සාධාරණ අවස්ථා තහවුරු කෙරෙන ගුණාංග වලින් හෙබි ක්‍රියාකාරි අධ්‍යාපන ප්‍රතිපත්තියක්, සැලැස්මක් හා ක්‍රමෝපායයන් හඳුනාගැනීම උදෙසා, අතිග රු ජනාධිපතිතුමන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එතුමන් හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2020 මාර්තු 31 දින 'ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික කටයුතු පිලිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය' ස්ථාපිත කරන ලදී.

එකී කාර්ය සාධක බලකායේ සාමාජික විද්වතුන් තිස්දෙනා (30) මෙන්ම, විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් දායකවූ තුන්සියයකට (300) ආසන්න විද්වතුන්, පිරිසකගේ දායකත්වයෙන් මාස පහකට (05) නොඅඩු කාලසීමාවක් තුල සකස් කර ඉදිරිපත් කරන ප්‍රතිපත්තිමය සංකල්ප පත්‍රිකාව මෙලෙස, සමාජ කතිකාවත උදෙසා ඉදිරිපත් කරන්නෙමු.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික කටයුතු පිලිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය
2020 අගෝස්තු 31

**“සෑම සමාජ පද්ධතියකම**
**එක සමාන අධ්‍යාපන අවස්ථා**
**ජනතාව වෙනුවෙන් විවෘත කර තැබිය යුතුය...”**


*- සී. ඩබ්. ඩබ්. කන්නන්ගර*

# අග්‍රගණ්‍ය ඉලක්ක

## 1

**ඵලදායී පුරවැසි ගුණාංග හා හැකියා සංවර්ධනය**

කාලීනවූ නව දැනුමින් සන්නද්ධ, ඉහළ ඉල්ලුමක් හා වටිනාකමකින් යුත් නිපුණතාවලින් සමන්විත, හැකියාවන් ගෙන් සපිරි හා ප්‍රශස්ථ ගුණාංග වලින් සවිබල ගැන්වුනු, සමාජ සංවේදී ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම.




## 2

**සමාජ සංවේදී පුරවැසි ගුණාංග හා හැකියා සංවර්ධනය**

විභාග කේන්ද්‍රීය අධ්‍යාපන රාමුවෙන් ඔබ්බට ගොස් විචාරාත්මක හා විශ්ලේෂණාත්මක චින්තනය දිරිගන්වමින්, සාකල්‍ය අධ්‍යාපනයක් හඳුන්වාදීම මගින්

1. නිර්මාණශීලීත්වය හා ආකල්ප සංවර්ධනය
2. ඉහළ ඔරොත්තුදීමේ හැකියා ගුණාංග වර්ධනය
3. ඉහළ සන්නිවේදන කුසලතා හා නිපුණතා සංවර්ධනය




## 3

**නවෝත්පාදන පුරවැසි ගුණාංග හා හැකියා සංවර්ධනය**

නව නිර්මාණාත්මක ප්‍රවේශයක් ඔස්සේ ඉදිරි දැක්මක් සහිත ගුණාංග හා හැකියා ඔප්නැංවෙන අයුරින්, සෑම දරුවෙකු තුළම සතිය (mindfulness) නිර්මාණශීලීත්වය, ව්‍යවසායකාත්මක කුසලතා ප්‍රවර්ධනය කෙරෙමින් විද්‍යාත්මක හා පර්යේෂණ හැකියා සංවර්ධනය.

**ගෝලීය නවෝත්පාදන දර්ශකය - 2020**



**#101**

- නිදසුනක් ලෙස, ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයන් සංඛ්‍යාව වැඩි වෙමින් තිබෙන මුත්, ගෝලීය ප්‍රමිති අනුව සලකා බැලූ කල අප සිටින්නේ පසුපසිනි.
- 2020 වසරේ ගෝලීය නවෝත්පාදන දර්ශකයෙහි රටවල් 131ක් අතරින් ශ්‍රී ලංකාව සිටියේ 101වන ස්ථානයෙහි ය. ලකුණු 100කින් ශ්‍රී ලංකාවට ලැබුණේ 31.25ක් පමණි. පළමු ස්ථානයට පත් ස්විට්සර්ලන්තයට 66.08ක් හිමි විය.

# මූලෝපාය සාරාංශය

## මෙහෙවර

- එලදායී
- නිර්මාණශීලී
- සමාජ සංවේදී

පුරවැසියෙක් නිර්මාණය කිරීම

## මූලික අභිමතාර්ථ

- ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ නුපුහුණු ශ්‍රමික ප්‍රතිශතය 2025 වර්ෂය වනවිට 30% සිට 10% දක්වා අවම කිරීම
- වර්ෂ 2030 වනවිට ශ්‍රී ලංකාව ආසියාතික කලාපයේ දැනුම් කෙන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම
- ගෝලීය ප්‍රවනතාවන් කෙරෙහි සංවේදී, තාක්ෂණික කුසලතාවන් සපිරි නිර්මාණශීලී චින්තකයින් නිර්මාණය කිරීම

## ප්‍රධාන අභියෝග

- වෙන් වෙන්ව කටයුතු කරන අධ්‍යාපනික දැනුම් ප්‍රවේශ වටිනාකම් දාමය ඒකාබද්ධ කිරීම
- අසංගත ගුණාත්මක ප්‍රමිතීන්, ජාත්‍යාන්තර ප්‍රමිතීන්ට අනුගත වන අයුරු පෙළ ගැස්වීම
- අධ්‍යාපන හා පර්යේෂණ ක්ෂෙත්‍රවල ප්‍රශස්ථ ලෙස රාජ්‍ය, පෞද්ගලික හා විදේශ ආධාර යෙදවීම මගින් ඉහළ ආයෝජන ප්‍රතිලාභ ජාතික ආර්ථිකය වෙත ප්‍රේෂණය කරවීම
- ශ්‍රම වෙළඳපලට සරිලන අයුරින් ආර්ථික හා සමාජ අවශ්‍යතාවලට අනුගත වෙමින්, අධ්‍යාපන හා කුසලතා වලින් සමන්විත මානව සම්පතක් බිහිකිරීම

## ප්‍රධාන ගුණාංග

- සියළු ජනවර්ග, ආගම්, පන්ති, කුල, ජාතීන්, අවතැන් වූවන්, විශේෂ කුසලතා, ආබාධ සහිත පුද්ගල පාර්ශව ඇතුලත් සියළු දෙනා වෙතම සමව ප්‍රවේශවිය හැකි අධ්‍යාපන අවස්ථා සැලසීම
- තොරතුරු තාක්ෂණයේ මනා සංකලනයකින් යුතුව සුහුරු අධ්‍යාපනයක් හා සුහුරු මූල්‍ය දැනුමැති, සතිය (mindfulness) හා නිපුණතාවයන්ගෙන් සවිබල ගැන්වූ ඩිජිටල්කරණ දැනුමින් සුපෝෂිත අධ්‍යාපනික පරිසරයක් නිර්මාණය කරදීම
- අධ්‍යාපනික වටිනාකම් දාමයේ අංශ තුල හා අංශ අතර සායෝගිතාවයන් වර්ධනය කිරීම
- පරිත්‍යාගශීලීන්, පෞද්ගලික අංශය මෙන්ම සුහුරු මූල්‍යකරණය තුලින් සම්පත් සචලන

# මූලෝපාය සාරාංශය

## සියලු අංශ සඳහා නිර්දේශ

### කෙටි කාලීන 2020-2021

පූර්ව ළමාවිය, සාමාන්‍ය, වෘත්තීය, උසස්, නවෝත්පාදන විශය පථයන් එක්කොට අධ්‍යාපන හෝ ළමානව සම්පත් සංවර්ධන යනුවෙන් නව අමාත්‍යාංශයක් ස්ථාපිත කිරීම

වර්ථමාන නීති / අනපනත් යළි සමාලෝචනය කර සංශෝධනය කරන තෙක් වූ අන්තර්කාල සඳහා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය නියාමනය සඳහා කාර්ය සාධක බලකායක් ස්ථාපිත කිරීම

අධ්‍යාපන හා නවෝත්පාදන ක්ශේත්‍රවල සිදු කෙරෙන සියළුම ආකාරයේ රාජ්‍ය ආයෝජන යළි සමාලෝචනය කිරීම

සියළු පන්තිකාමර ආශ්‍රිතව මිශ්‍ර ඉගෙනුම් ක්‍රියාවලියක් (Blended learning) ස්ථාපිත කිරීම සඳහා නව තාක්ෂණ පහසුකම් සැලසීම

විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, ගණිත හා කලා (STEAM) අධ්‍යාපන පහසුකම් සියළුම විභවයන් සහිත පාසල් ආශ්‍රිතව කඩිනමින් ආරම්භ කිරීම

සුහුරු තාක්ෂණයන්, විකල්ප ඉගැන්වීම් ක්‍රම, සති, මනෝ සමාජ දැනුම පිලිබඳව රාජ්‍ය සහ පෞද්ගලික පාසල්වල ගුරුභවතුන් කඩිනමින් පුහුණු කිරීම

අවසාන, සාරාංශගත විභාග සඳහා අඩු බරක් තැබීම සහ ආකෘතික ඇගයීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සහතික කිරීම

සති අධ්‍යාපනය (Mindfulness education) සමස්ථ අධ්‍යාපනික ඉගෙනුම් ක්‍රියාවලියට කඩිනමින් අන්තර්ගත කිරීම

අධ්‍යාපන ක්‍රමය තුල සියළුම ස්වරූපයේ හිංසනය හා ප්‍රචණ්ඩත්වය වහාම අහෝසි කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග

### මධ්‍ය කාලීන 2020-2023

අධ්‍යාපනයේ සමස්ථ වටිනාකම් දාමය වෙනුවෙන් ඒකාබද්ධ ඉගෙනුම් කළමනාකරන පද්ධතියක් ස්ථාපනය කිරීම

සියළුම සිසුන් හට නිර්බාධිතව අන්තර්ජාල හා පරිග්‍රාහකමය මෙවලම් සපායාගැනීමේ හැකියාව තහවුරු කිරීම

කාලීන අවශ්‍යතාවලට ගැලපෙන අයුරින් නව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හඳුන්වාදීම හා දැනට පවතින අනපනත් යළි සමාලෝචනය කර සංශෝධනය කිරීම

ඉහළ අධ්‍යාපන සුදුසුකම් සඳහා නිර්බාධිතව ප්‍රවේශවීම සහතික කිරීම සඳහා බහුවිද අධ්‍යාපන ප්‍රවේශ මාර්ග තහවුරු කිරීම්

සමස්ථ අධ්‍යාපනික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට වෘත්තිය මාර්ගෝපදෙශනය අන්තර්ගත කිරීම

විෂයමාලා සංවර්ධනය උදෙසාම වන ස්වාධීන ආයතනයක් ස්ථාපිත කිරීම

ගුරුවරයෙකු ලෙස වෘත්තීමය සුදුසුකම් කරා ලඟාවීම සඳහා ප්‍රමිතිගත ප්‍රවේශමාර්ග විවෘත කරදීම හා දිරි ගැන්වීම

ගුරුභවතුන්ගේ කාර්ය සාධනය වර්ධනය වීම සහතික වනු පිනිස නව ක්‍රමෝපායන් හඳුන්වාදීම

නිර්මිත හා ප්‍රධාන අධ්‍යාපනික කාර්ය සාධක දර්ශක ඉතා ඉහළ ගුණාත්මක තත්ව යටතේ තත්ව සහතික ක්‍රියාවලින් ස්ථාපිත කිරීම හා නියාමනය

ඒකාබද්ධ ගුණාංගයක් සැලසුම් කරන්න පොදු ක්‍රමයක් සහිත සහතික කිරීමේ පද්ධතිය KPI සඳහා උපකරණ පුවරුව

### දිගු කාලීන 2020-2025

සියළුම සිසුන්ගේ කුසලතා හා අභිරුචිකත්වයන් හඳුනාගැනීම සහතික වනු පිනිස මාර්ගෝපදේශ උපදේශකවරුන් පත්කිරීම හා අවශ්‍ය පහසුකම් සැලසීම

ගෝලීය යහභාවිතාවක් හා වෙළඳපල නිපුණතා සමඟ අනුගත වන අයුරින් සියළු විෂයමාලා යාවත්කාලීන කිරීම

පෞද්ගලික හා ජාත්‍යාන්තර පාසැල්, පෞද්ගලික විශ්ව විද්‍යාල, වෘත්තිය අධ්‍යාපන ආයතන වල ගුණාත්ම තත්වයන් තහවුරුවීම සහතිකවනු පිනිස නියාමන පද්ධතියක් ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකා ගුරු සේවය මධ්‍යගත රාජ්‍ය සේවාවක් ලෙස ස්ථාපිත කිරීම

සියළු සිසුන්ගේ මානසික යහපැවැත්ම හා සුභසාධනය උදෙසා සියළු ආයතන ආශ්‍රිතව පුහුණු උපදේෂක / චිකිත්සක සේවා පහසුකම් තහවුරු කිරීම

# ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් පත්කළ පූර්ව ළමාවිය, සාමාන්‍ය, වෘත්තීය හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍ර උප කමිටුවලින් ඉදිරිපත්වූ නිර්දේශ වල සාරාංශය

## 1. දැනට පවතින අධ්‍යාපන ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීම

a. පූර්ව ළමාවිය, සාමාන්‍ය, උසස් සහ වෘත්තීය අධ්‍යාපනය ක්ෂේත්‍ර සම්බන්ධ සමෝධානික වගකීම් සහිතව එක් නව අධ්‍යාපන හෝ මානව සම්පත් සංවර්ධන යන නාමය යටතේ අමාත්‍යාංශයක් ස්ථාපිත කිරීම. එම අමාත්‍යාංශය කැබිනට් ඇමතිවරයකු හා ඉහත කී එක් එක් ක්ෂේත්‍රය අධීක්ෂණය කිරීම සඳහා පත් කරන ලද රාජ්‍ය/ නියෝජ්‍ය ඇමතිවරුන් තිදෙනෙකු හෝ හතර දෙනෙකු යටතේ පැවතිය යුතු ය.

b. අධ්‍යාපනය වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක් ගොඩනැගීම සහ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස දැනට පවත්නා නීති සමාලෝචනය කර සංශෝධනය කිරීම් විශ්වවිද්‍යාල පනත සහ දැනට පවත්නා අධ්‍යාපන අණ පනත් සියල්ලම කැටිකොට එක් පොදු අධ්‍යාපන පනතක් කඩිනමින් සකස් කිරීම.

c. දැනට පවත්නා නීතිවලට අවශ්‍ය සංශෝධන සිදුකරන තෙක් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිණිස, නිශ්චිත කෙටි කාලසීමාවක් සඳහා ස්වාධීන අධිකාරියක්/ කාර්ය සාධන බලකායක් ස්ථාපිත කිරීම. ජාතික අධ්‍යාපන ආයතනය අන්තර් කළමනාකරණ ව්‍යුහයේ වගකීම් තුළට අයත් වන අතර ගුරු පුහුණුවේ සහ ඉගෙනුම් අන්තර්ගතයේත්, පන්ති කාමරවලත් ගුණාත්මකභාවය තහවුරු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

d. ජාතික විෂයමාලා සංවර්ධනය සඳහා ම වෙන්වූ ස්වාධීන ආයතනයක් පිහිටුවීම.

e. ජාතික සහ පළාත් මට්ටම්වල ඒකාබද්ධතාව තහවුරු කිරීම පිණිස, සියලු පළාත් වල අධ්‍යාපන කටයුතු ආශ්‍රිත පුළුල් ක්‍රියාකාරිත්වයන් පළාත් අධ්‍යාපන ලේකම් වෙත පැවරිය යුතු ය. දිස්ත්‍රික්, කොට්ඨාස සහ පාසල් මට්ටමේදී ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීමේ පූර්ණ වගකීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත පැවරිය යුතුය.

## 2. ඒකාබද්ධ වටිනාකම් දාමයක් සඳහා පහසුකම් සැලසීම

a. දැනට උසස් ක්ෂේත්‍රය තුල ක්‍රියාත්මක අධ්‍යාපන සහ පර්යේෂණ ජාලය (LEARN) වැනි ජාලයක් අධ්‍යාපනයේ සෑම අංශයක් ම සම්බන්ධ වන අයුරින් සමෝධානික ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කල යුතු අතර එම පද්ධතිය වෙත පැවරෙන වෙනත් වගකීම් අතර පහත දැක්වෙන මූලිකාංග ද අඩංගු විය යුතු ය:

- ශ්‍රේණි සහ විෂය නිර්දේශවලට නිශ්චිතව අදාළ වන මාර්ගෝපදේශ සහ ඉගෙනුම් අන්තර්ගතය
- අන්තර්ජාලය හරහා පන්ති මෙහෙයවීම සඳහා සහභාගීත්ව වේදිකාවක් (digital engagement platform)
- ශිෂ්‍ය ඇගයීම්, ශ්‍රේණිගත කිරීම් සහ ප්‍රතිපෝෂණය ලබාගැනීම සඳහා බිහිදොරක් (portal) නිර්මාණය කිරීම
- නිපුණතා පත්‍රය (Skills Passport) (මෙම ලේඛනයේ පසු අවස්ථාවක පැහැදිලි කරන ලැබේ) ඩිජිටල් ස්වරූපයෙන් නිර්මාණය කිරීම
- ඩිජිටල් අධ්‍යාපනික අන්තර්ගතයන් සඳහා විද්‍යුත් පුස්තකාලයක් සහ කෝෂ්ඨාගාරයක් (e-library and repository)
- විශ්වවිද්‍යාලයකට ඇතුළත් නොවී (මුදලක් ගෙවා හෝ) ඩිජිටල් පාඨමාලා හැදෑරීම සහ ප්‍රමිතිගත කුසලතා සහතික උපයා ගැනීම සඳහා විධිවිධාන
- දත්ත වල ආරක්ෂාව සහ පෞද්ගලිකත්වය සහතික කිරීම (data security and privacy)

b. ප්‍රධාන අධ්‍යාපනික ක්ෂේත්‍ර අතර අන්තර් සම්බන්ධකම් තිබෙන බහුවිධ ප්‍රගති මාර්ග (multiple progression pathways) අධ්‍යයනය, සංශෝධනය සහ ස්ථාපිත කිරීම.

c. 21වන සියවසට ඔබින කුසලතාවයන්ගෙන් සමන්විත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා ගෝලීය යහභාවිතාවන්ට සහ දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ නිපුණතා අවශ්‍යතාවන්ට අනුගත වන පරිදි සියලු විෂයමාලා යාවත්කාලීන කිරීම මගින් සෑම මට්ටමක ම අන්තර්ගතයන් සහ රැකියා වෙළඳපොළ ඉල්ලුම අතර සම්බන්ධය තහවුරු කිරීම.

d. පාසල් කාලසීමාවේ වැදගත් විවිධ ශ්‍රේණි අදියරවලදී ශිෂ්‍යයන් අනිවාර්යයෙන් රැකියා මාර්ගෝපදේශ ලබාගන්නා බව තහවුරු කිරීම. ශිෂ්‍ය කුසලතා සහ අභිරුචීන් හඳුනාගැනීම සඳහා මාර්ගෝපදේශ උපදේශකවරුන් පුහුණු කිරීම. ඒ අනුව, සුදුසු අධ්‍යයනයන් සහ වෘත්තීය මාර්ග වෙත සිසුන් සහ මව්පියන්/ භාරකරුවන් යොමු කිරීම සඳහා පහසුකම් සැපයීම.


e. පෞද්ගලික සහ ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය කිරීම සහ සහයෝගය සඳහා පරිපූර්ණ නියාමන පද්ධතියක් හඳුන්වාදීම.

## 3. විෂයමාලාව සහ ඉගෙනුම් ක්‍රමවේදය සංශෝධනය කිරීම

a. විෂයමාලාව සංවර්ධනය කිරීම සහ ඇගයීම සඳහා සියලු විෂයමාලා ගෝලීය යහභාවිතාවන්ට සහ දේශීය කර්මාන්ත හා සේවා අවශ්‍යතාවන්ට අනුකූලව යාවත්කාලීන කිරීම සඳහා වගකීම් පවරන ලද ඉහළ මට්ටමේ අනු ස්වාධීන ආයතනයක් ජාතික අධ්‍යාපන කොමිෂම යටතේ ස්ථාපිත කිරීම.

b. සිසුන් සම්ප්‍රදායික මෙන් ම ඩිජිටල් ඉගෙනුම් මාර්ගයන් වෙත ද නිරාවරණය පරිදි 'මිශ්‍ර ඉගෙනීම්' (blended learning) තාක්ෂණයන් සඳහා පහසුකම් සැපයීම. ඒ අතරතුර, පුළුල් පරාසයක ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රම සහ පන්ති කාමරය තුළ ශිෂ්‍ය කාර්යයන් ප්‍රශස්තව සම්බන්ධ කරගැනීම.

c. සිසුන්ට නිවසේ සිට ම අන්තර්ගතය (content) සමග ඩිජිටල් හෝ වෙනත් ආකාරයකින් සම්බන්ධ විය හැකි, අනතුරුව පාසලේදී ඒ හා සම්බන්ධ කාර්යයන් කළ හැකි 'Flipped Classroom' වැනි මිශ්‍ර අධ්‍යාපන සංකල්ප හඳුන්වා දීම. ස්වාධීන අධ්‍යයනය සහ ශිෂ්‍යයන් විසින් මෙහෙයවනු ලබන පර්යේෂණ සඳහා දිරිගැන්වීම.



d. විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත (STEAM) අධ්‍යාපනය ප්‍රමුඛ මූලධර්මයක් ලෙස සියලු පන්ති කාමරවල සිදු වන බව තහවුරු කිරීම් මෙම විෂය ධාරා මූලික විෂය කලාපවලට ඇතුළත් කළ යුතු ය.

## 4. පරිපූර්ණ සහ ප්‍රමිතිගත ගුරු සංවර්ධනය

a. ගුරුවරයකු ලෙස පිළිගැනීම ඇති කරගැනීම සඳහා ඉගෙනුම් මාර්ග (learning pathways) විධිමත් කිරීම. සෑම ගුරුවරයකුම අධ්‍යාපනවේදී හෝ සමාන උපාධියක් තුළින් ලබාගත යුතු ගතිලක්ෂණ වලින් සමන්විත කරවීම උදෙසා

b. 'ගුරු සේවය' මද්‍යගත රාජ්‍ය සේවාවක් බවට පත් කර එයට නිසි පිළිගැනීම ලබා දීම.

c. සියලු ගුරු භවතුන් හට පහත දැක්වෙන අංශවල අනිවාර්ය පුහුණුවක් ලබා දීම.

- ඩිජිටල් මෙවලම් සහ ඒකාබද්ධ ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් සහ අන්තර්ගතය ඩිජිටල්කරණය කිරීම පිලිබඳ දැනුම
- සියල්ලන් ඇතුළත් කරගන්නා අධ්‍යාපනය (inclusive education) තහවුරු කිරීම පිණිස වෙනස් ඉගෙනුම් ක්‍රමවේද සහ හැකියාවන් අන්තර්ගත කරගැනීම සඳහා විකල්ප ඉගැන්වීම් ක්‍රමවේද. (උදාහරණයක් ලෙස, විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් හඳුනාගැනීම බව සහ ඔවුන්ට සේවා සපයනු ලබන බව තහවුරු කිරීම සඳහා)
- සිසුන්ට මනෝ සමාජ (psychosocial) සහාය ලබාදීම



## 5. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආයෝජන සහ අධ්‍යාපන සම්පත් ප්‍රශස්තව ප්‍රතිසංවිධානය කිරීම

a. අතීත සහ වර්තමාන අයවැය ප්‍රතිපාදන ඇගයීමල ආයෝජන ප්‍රතිලාභ මත පදනම්ව සහ ආයෝජනය හා අවශ්‍යතා මත පදනම්ව තක්සේරු කරන ලද ප්‍රතිලාභ නැවත විශ්ලේෂණය කිරීම.

b. බාහිර ආධාරකරුවන්ගේ (donor funding) ආධාර මත රඳා පැවතීම හැකිතාක් දුරට සීමා කිරීම. හුදෙක් ආධාර හෝ ණය වෙනුවට, අභ්‍යන්තරිකව වගවීමේ ව්‍යුහයක් තිබෙන ණය ආධාර ලබාගැනීම කෙරෙහි අලුතින් අවධානය යොමු කිරීම.

c. අධ්‍යාපනික උපකරණ හා මෙවලම් සපයා ගැනීමේ හැකියාව, පාසල් පරිශ්‍රය තුළ සම්බන්ධතාව, අධ්‍යාපන කලාප තුළ හා අතර සම්බන්ධතාව සහ සිසුන් සහ ගුරුවරුන් අතර සම්බන්ධතාව ආදිය පිළිබඳ ඩිජිටල් අවශ්‍යතා තක්සේරුවක් මගින් මෙහෙයවීම.

d. අවශ්‍ය අධ්‍යාපනික මෙවලම් සපයා ගැනීම හා බෙදාහැරීම සහ සියලු අධ්‍යාපනඥයන්ට සහ සිසුන්ට අන්තර්ජාල සම්බන්ධතා පහසුකම තහවුරු කිරීම. ඒ වෙනුවෙන් සිසුන්ට හා දෙමව්පියන් වෙත සහනදායී ණය පහසුකම් ලබා දීම ද මෙයට ඇතුළත් ය.

e. මුද්‍රණ හා පාරිසරික පිරිවැය අවම කිරීම සඳහා පෙළපොත් ඩිජිටල් කළමනාකරන පද්ධතියක් හඳුන්වා දීම.

## 6. අඛණ්ඩ තත්ත්ව සහතික කිරීමක් හා පාලනයක් ඇති කිරීම

a. අධ්‍යාපන පද්ධතිය තුළ දැනටමත් ක්‍රියාත්මක සාර්ථක ක්‍රියාමාර්ග ඇගයීම සහ නිසි පරිදි යාවත්කාලින / සංශෝධන කිරීම. ගුරුවරුන් හා විදුහල්පතිවරුන්ගේ හැකියා තක්සේරු කිරීම, ඉගෙනුම් අන්තර්ගතයන් නිරතුරුව සමාලෝචනය කිරීම යනාදිය.

b. සාර්ථකත්වය මැන බැලීම සඳහා මෙකී මිනුම් දඬු මත පදනම්ව, අධ්‍යාපනයේ සෑම අංශයක් සමග ම සම්බන්ධ වන ඒකාබද්ධ තත්ව සහතික කිරීමේ පද්ධතියක් (integrated quality assurance system) සැලසුම් කිරීම සහ මෘදු කුසලතා (soft skills) සහ උගත් දැනුමේ සහ කුසලතාවල ප්‍රායෝගික භාවිතය පිළිබඳ ප්‍රධාන කාර්යසාධන දර්ශක සම්පාදනය කිරීම (KPIs).

c. ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) පරාසයක් තුළ සාර්ථකත්වය තක්සේරු කිරීමේ පොදු මිනුම් පුවරුවක් (dashboard) ස්ථාපනය කිරීම.

d. වාර්ෂික මෙන්ම අවසන්, සමාකලනීය විභාග කෙරෙහි අඩු අවධාරණයක් කිරීම සහ නිර්මාණශීලීත්වය දිරිගන්වන, ව්‍යාපෘති පාදක පැවරුම් වැනි විචාරාත්මක චින්තනය, විශ්ලේෂණ කෞශල්‍යය සහ වෙනත් නිපුණතා අවුරුද්ද පුරා ඇගයීමට ලක් කරන කාර්යයන් වෙත වැඩි අවධාරණයක් ඇති කිරීම.

## 7. අධ්‍යාපන පද්ධතිය තුළ වටිනාකම් පද්ධති ගොඩනැගීම

a. සිසුන් තුළ ස්වයං අවබෝධය, අවධානය සහ සහකම්පනය ඇති කිරීම සඳහා සෑම පාසලකට ම හා අධ්‍යාපනික ආයතනයකට ම සති අධ්‍යාපනය (mindfulness education) හඳුන්වා දීම. (ගෝලීය වශයෙන්ම, සිහි නුවණින් යුතුබව පදනම් කරගත් අධ්‍යාපන ක්‍රම කෙරෙහි වැඩි අවධානයක් තිබේ. එබැවින් යෝගා සහ භාවනා වැනි කාරණා කෙරෙහි ආකර්ශනයක් ද තිබේ. සතිය සම්බන්ධ භාවිතාවන් බොහෝ විට සිසුන්ට හඳුන්වා දෙනු ලබන්නේ පෙර පාසල් මට්ටමේදී ය. ඉන්පසු, ඒවා පන්ති කාමර භාවිතයට යොදා ගනු ලැබේ.)

b. අධ්‍යාපන පද්ධතිය තුළ ඕනෑම හා සෑම ස්වරූපයක ම හිංසා සහ ප්‍රචණ්ඩත්වය දුරලීම:

- නවක වධය වැළැක්වීමේ පනත දැඩිව ක්‍රියාත්මක කිරීම
- අනිවාර්ය ශිෂ්‍ය මාර්ගෝපදේශ වැඩසටහන් සහ නවක වධ සහ හිංසන වින්දිතයන්ට සහන සැලසීමේ වැඩසටහන් හඳුන්වාදීම
- නවක වධ හා ප්‍රචණ්ඩ සිදුවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නීති බලාත්මක කිරීමේ අධිකාරීන් බලසතු කිරීම

c. මානසික යහපැවැත්ම සහ ශිෂ්‍ය සුබසාධනය තහවුරු කිරීම සඳහා සියලු අධ්‍යාපනික ආයතනවලට පුහුණු උපදේශකවරුන්/ චිකිත්සකවරුන් සිටින බව සහතික කිරීම.

# මූලෝපාය සාරාංශය

## නිශ්චිත අංශ සඳහා නිර්දේශ

| | කෙටි කාලීන 2020-2021 | මධ්‍ය කාලීන 2020-2023 | දිගු කාලීන 2020-2025 |
|---|---|---|---|
| සාමාන්‍ය අධ්‍යාපනය | ජාතික භාෂා හා සම්බන්ධීකරණ භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව අනිවාර්යයෙන් ඉගැන්වීම<br><br>සර්වසම පෙර පාසැල් විෂයමාලාවක් ගොඩනැගීම<br><br>විෂයමාලා සංවර්ධනය සඳහා ස්වාදීන ආයතනයක් සංක්ෂිප්ත කිරීම<br><br>'නිපුනතා බලපත්‍රයක්' හඳුන්වා දීම | ශිෂ්‍ය තක්සේරු කිරීම් මගින් කටපාඩම් කිරීමේ අධ්‍යාපනය වෙනුවට විචාරාත්මක චින්තනය සහ විශ්ලේෂණාත්මක කුසලතා තහවුරු කිරීම<br><br>ද්විතියක අධ්‍යාපනයට ඇතුළත් වීම සඳහා වෙනත් යෝග්‍යතා පරීක්ෂණයක් සම්පාදනය කර 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය අහෝසි කිරීම් මෙම පරීක්ෂණය විසින් චිත්තවේගී බුද්ධිය, සාමාන්‍ය හැකියාවන්/ අභියෝග්‍යතා සහ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා කෙරෙහි අවධානය යොමු කිරීම<br><br>පුරවැසිභාවය සහ ආචාරධර්ම, සන්සන්දනාත්මක ආගම් සහ ලිංගික අධ්‍යාපනය මූලික විෂයන් ලෙස මූලධාරාගත කිරීම | පාසල් සියල්ල යලි නිසි ලෙස වර්ගීකරණය හා ඇගයීමට ලක් කර සංශෝධනය කිරීම<br><br>අධ්‍යාපන කලාප දිවයිනේ පරිපාලන කලාප සමග සමපාත කිරීම<br><br>සියලු පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීම හා නිරන්තර නියාමනයට අනුගත කිරීම<br><br>කුසලතා, රුචිකත්වයන් සහ වෘත්තීය මාර්ග හඳුනා ගැනීම සඳහා පුහුණු මාර්ගෝපදේශක උපදේශකයින් හමුවීමට සිසුන්ට අනිවාර්ය වේ |
| TVET තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය | පාඨමාලා අන්තර්ගතය සහ පාඨමාලා නාමාවලිය දේශීය හා ගෝලීය කර්මාන්ත හා සේවා ක්ෂේත්‍ර වල අපේක්ෂා සහ අවශ්‍යතා සමග අනුගත වන පරිදි පුළුල් කිරීම<br><br>ඩිජිටල් අවශ්‍යතා තක්සේරුවක් කිරීම | කර්මාන්ත තුළ රැකියාව කරමින් පුහුණු වීමේ අවස්ථා සම්පාදනය කිරීම<br><br>සියලු තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනික සුදුසුකම් ඒකරාශී කර 'එක් ඇගයීමක් - එක් සහතිකයක්' සංකල්පය ප්‍රවර්ධනය කිරීම | තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන සිසුන් සඳහා තිබෙන පිළිගැනීම වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා යෝග්‍යතා කාර්ය රාමුව (SLQF) සමග කටයුතු කිරීම |
| උසස් සහ වෘත්තීය අධ්‍යාපනය | ඩිජිටල් අවශ්‍යතා තක්සේරුවක් කිරීම<br><br>තොරතුරු තාක්ෂණය සහ ඉංග්‍රීසි භාෂාව සම්බන්ධ ඩිජිටල් පාඨමාලා විශ්වවිද්‍යාලවල අත්‍යවශ්‍ය හා අනිවාර්ය පාඨමාලා බවට පත්කිරීම<br><br>ස්වාධීන අධ්‍යයන සහ විෂයාන්තර පර්යේෂණ දිරිගන්වන පාඩම් මාලා හඳුන්වා දීම | උසස් පෙළ පිළිතුරු පත්‍ර ඇගයීමේ ක්‍රමය හා විශ්වවිද්‍යාලවලට තෝරාගැනීමේ ක්‍රමය විධිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම<br><br>විශ්වවිද්‍යාලවලට තෝරාගැනීම සම්බන්ධයෙන් විකල්ප, වඩාත් සාධාරණ නිර්ණායක නිර්මාණය කිරීම<br><br>විශ්වවිද්‍යාලවල ශාස්ත්‍රීය දිනදර්ශන සමකාලික කිරීම<br><br>ආර්ථිකයේ කර්මාන්ත හා සේවා අවශ්‍යතාවන්ට අනුකූලව විශ්වවිද්‍යාල පාඨමාලා නාමාවලිය පුළුල් කර යාවත්කාලීන කිරීම<br><br>සිසුන් වෙනුවෙන් පර්යේෂණ ප්‍රතිපාදන සහ සම්මාන ක්‍රම සම්පාදනය කිරීම<br><br>ජාතික විවෘත අධ්‍යාපන සම්පත් ප්‍රතිපත්තියක් (National Open Educational Resource Policy) සංවර්ධනය කිරීම | ශ්‍රී ලංකාව ආසියා කලාපයේ අධ්‍යාපනික මධ්‍යස්ථානයක් බවට පත් කිරීම<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ අතථ්‍ය විශ්වවිද්‍යාලයක් (virutal university) පිහිටුවීම<br><br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය පුළුල් කිරීම, ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටුවීම සහ විෂයාන්තර පාඨමාලා සඳහා අවසර දීම<br><br>විදේශ විශ්වවිද්‍යාල සමග හවුල්කාරිත්වයන්ට පහසුකම් සැපයීම<br><br>ජාත්‍යන්තර ශිෂ්‍ය වීසා ක්‍රමයක් ඇතිකිරීම |

# මූලෝපාය සාරාංශය

## නිශ්චිත අංශ සඳහා නිර්දේශ


| | කෙටි කාලීන 2020-2021 | මධ්‍ය කාලීන 2020-2023 | දිගු කාලීන 2020-2025 |
|---|---|---|---|
| හෙද අධ්‍යාපන අංශය | හෙද පුහුණු පාසල් උපාධියකට සමාන සුදුසුකමක් ප්‍රදානය කිරීම<br><br>සංශෝධිත විශ්ව විද්‍යාල පනත හා SLQF අනුව හෙද පුහුණු මාලා සංවර්ධනය කිරීම්<br><br>SLQF 6 වන මට්ටමට අනුකූලව නව පාඨමාලා ව්‍යුහයක් සංවර්ධනය කිරීම<br><br>CPD පාඨමාලා නාමාවලිය පුළුල් කිරීම<br><br>ඉහළ මට්ටමේ උපාධි පාඨමාලාවක් නියම කිරීම<br><br>සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ ස්ථානගත කිරීම සඳහා පොදු කුසලතා ලයිස්තුවක් සෑකසීම<br><br>ශ්‍රී ලංකා හෙද සභාව නැවත ස්ථාපිත කිරීම | ප්‍රමාණවත් උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් කිරීම<br><br>හෙද උපාධිධාරීන් ලියාපදිංචි කිරීම සඳහා SLNC(Sri Lanka Nursing Council) පනත සංශෝධනය කිරීම<br><br>විශේෂිත ඒකකවල සේවය කරන හෙදියන් සඳහා සේවා වැඩසටහන් සෑකසීම<br><br>දුරස්ථ ඉගෙනීම් සහිත ඉහළ මට්ටමේ උපාධි මාලාවක් නියම කිරීම<br><br>21 වන සියවසේ අභියෝගයන්ට මුහුණ දීම සඳහා සඳහා වර්තමාන අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය වැඩසටහන් සංශෝධනය කිරීම | හෙද අධ්‍යාපනය සඳහා විශ්ව විද්‍යාලයක් පිහිටුවීම<br><br>සියලුම හෙද පුහුණු පාසල් යෝජිත විශ්ව විද්‍යාලයේ පීඨයක ලෙස පිහිටුවීම<br><br>පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ස්ථාපිත කිරීම<br><br>හෙද හෝ මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති සුදුසුකම් ඇති කිරීම<br><br>ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හෙද උපාධියක් පිහිටුවීම |

# නිශ්චිත අංශ සඳහා නිර්දේශ

## සාමාන්‍ය අධ්‍යාපනය

1. අධ්‍යාපන කලාප දිවයිනේ වර්තමාන පරිපාලන කලාප සමග සමපාත කිරීම සමග විශේෂිත පොකුරු පාසල් ඇතිකිරීම.
   - සෑම පොකුරක් ම පරිපාලනය කල යුත්තේ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසිනි. එමගින් පොකුර තුළ වැඩි සම්බන්ධීකරණයක් සහ ප්‍රධාන පහසුකම් හා අධ්‍යාපනික සම්පත් බෙදාහදාගැනීමක් සිදු කෙරේ (පුස්තකාල, විද්‍යාගාර, ක්‍රීඩා පිට්ටනි වැනි).

2. දැනට ක්‍රියාත්මක පාසල් වර්ගීකරණය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ:
   - තිබෙන සියලුම පාසල් 'ප්‍රාථමික සහ ද්විතීයක' ලෙස වර්ගීකරණය කිරීම
   - පහත රූපසටහනේ දැක්වෙන ආකාරයට අන්‍යෝන්‍ය වශයෙන් පෝෂණය වන පරිදි පොකුරුවල පාසල් සංවර්ධනය කිරීම.
   - මූලික භාෂාව සහ සංඛ්‍යාත්මක සාක්ෂරතාවය සහ සම වයසේ මිතුරන් සමඟ සමාජ සම්බන්ධතා වර්ධනය කිරීම ඇතුළුව ඒකාකාරී විෂය නිර්දේශයක් වර්ධනය කිරීම




   - සියලු පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි බව තහවුරු කිරීම හා විධිමත් හා ගුණාත්මක නියාමන යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම.

3. පහත දැක්වෙන මූලික විෂයයන් පාසල් විෂයමාලාවට එක්කිරීම:

- විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත (STEAM) අධ්‍යාපන සංකල්පයට නිරාවරණය
- සන්සන්දනාත්මක ආගම්
- පුරවැසිභාවය සහ ආචාර ධර්ම
- මනෝවිද්‍යානුකූලව සකස් කල ලිංගික අධ්‍යාපනය

4. ශිෂ්‍ය මැදිහත්වීම, අවබෝධය සහ උගත් දැනුම භාවිතා කිරීම සහ කණ්ඩායමක් ලෙස ක්‍රියා කිරීම ආදිය ඇතුළත් වන පරිදි නිර්මාණශීලීත්වය දිරිගන්වන ඇගයීම් කෙරෙහි වැඩි අවධාරණයක් සහිතව ශිෂ්‍ය ප්‍රගතිය අඛණ්ඩව ඇගයීම සඳහා කාර්ය රාමුවක් සහ මාර්ගෝපදේශ හඳුන්වා දීම.

- ද්විතීයක අධ්‍යාපනයට ඇතුළත් වීම සඳහා නව යෝග්‍යතා පරීක්ෂණයක් සම්පාදනය කර 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය අහෝසි කිරීම. මෙම පරීක්ෂණය විසින් චිත්තවේගී බුද්ධිය, සාමාන්‍ය හැකියාවන්/ අභියෝග්‍යතා සහ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා කෙරෙහි අවධානය යොමු කිරීම.

5. භාෂා නිපුණතා පරීක්ෂා කිරීමේදී, කියවීම, සවන් දීම හා කතාකිරීම සම්බන්ධ හැකියාවන් මෙන් ම ලිවීමේ කුසලතා තක්සේරු කිරීම.

- ප්‍රධාන විෂයමාලාවේ කොටසක් ලෙස කියවීමේ පැවරුම් සකස් කළ යුත්තේ ‘ස්වාධීන විෂයමාලා සංවර්ධන ආයතනය’, විසිනි. තනි පුද්ගල හෝ කණ්ඩායම් පැවරුම් එයට ඇතුළත් විය හැකි ය. එහිදී සිසුන් විසින් අදාළ කෘති සම්බන්ධයෙන් විචාරාත්මක ඉදිරිපත් කිරීම් කරනු ඇත. මෙම පැවරුම් ඇගයීම අවසන් ඇගයීමට ඇතුළත් කරගනු ලැබේ.

6. ප්‍රජා සේවය, විෂය බාහිර හා විෂය සමගාමී ක්‍රියාකාරකම්, ක්‍රීඩා, සේවා පළපුරුද්ද ආදිය සැලකිල්ලට ගන්නා ‘නිපුණතා පත්‍රයක්’, හඳුන්වා දෙනු ලැබේ. එය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අනිවාර්ය සුදුසුකමක් වනු ඇත.

7. නිපුණතා සහ අභිරුචීන් හඳුනාගැනීම සඳහා ශිෂ්‍යයන් අනිවාර්යයෙන් ම පුහුණු මාර්ගෝපදේශ උපදේශකවරුන් හමු විය යුතු ය. එම හමුවීම් පාසල් අධ්‍යයන කාලසීමාව තුළ සහ වෘත්තීය අධ්‍යයන කාල සීමාව තුල සෑම වැදගත් සන්ධිස්ථානයකදී ම සිදු විය යුතු ය.

- ‘නිපුණතා පත්‍රයක්’, නිර්මාණය කල යුත්තේ මාර්ගෝපදේශ උපදේශකවරයාගේ උපදෙස් ලබාගනිමිනි.
- ශිෂ්‍ය හැකියාවන් හඳුනාගෙන, ඉගෙනුම් අවස්ථා සහ රැකියා මාර්ග සඳහා සිසුන් යොමුකිරීම සඳහා මාර්ගෝපදේශ උපදේශකවරුන්ට පහසුකම් සැපයීම.
- සිසුන්ට නිසි වෘත්තීය මාර්ගෝපදේශනයක් ලැබෙන බව සහතික කිරීමෙන් අනතුරුව පාසල් සිසුන්ට වෘත්තීය පුහුණු අංශය සමග සම්බන්ධ වීම සඳහා පහසුකම් සැපයිය හැකි නිශ්චිත ඇතුළු වීමේ/ පිටවීමේ ස්ථාන හඳුනා ගැනීම. (සිසුන් පාසල්වලින් ඉවතට විසිවීම සිදු නොවීම සඳහා වග බලාගත යුතුය).

## තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව

1. පාඨමාලා අන්තර්ගතය කර්මාන්ත අපේක්ෂාවන්ට අනුගත බව තහවුරු කිරීම සහ සිසුන්ට තාක්ෂණික විශේෂඥභාවයට අමතරව මෘදු කුසලතා, විචාරාත්මක චින්තනය, විශ්ලේෂණීය සහ සන්නිවේදන කුසලතාවලින් සන්නද්ධ කිරීම.

2. වැඩ පරිසරයේ වෙනස්කම් නිරූපණය වන පරිදි සහ අනාගතයට යෝග්‍ය නිපුණතාවලින් සහ තාක්ෂණික පුහුණුවෙන් සිසුන් සන්නද්ධ වී ඇති බව තහවුරු කිරීම සඳහා වර්තමාන පාඨමාලා නාමාවලිය පුළුල් කිරීම සහ යාවත්කාලීන කිරීම.

3. රැකියාව කරන ගමන් පුහුණු වීම සඳහා සහ පාඨමාලාවල සම්මාන ලෙස සැලකිය හැකි පළපුරුද්ද ලබාගැනීම සඳහා සිසුන්ට අවස්ථා සම්පාදනය කිරීම.

4. සියලු තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුවීම් වෙනුවෙන් 'එක් ඇගයීමක් - එක් විද්‍යුත් සහතිකයක්' යන සංකල්පය ස්ථාපිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

5. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ලබාගන්නා හෝ සේවාව අතරතුර පුහුණුවීම සිදුකරන හෝ සිසුන්ට පිළිගැනීම ඇති කිරීම සඳහා ශ්‍රී ලංකා සුදුසුකම් කාර්ය රාමුව අනුව වැඩ කිරීම.



## උසස් සහ වෘත්තීය අධ්‍යාපනය

1. උසස් පෙළ පිළිතුරු පත්‍ර ඇගයීමේ හා විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ ප්‍රමාදය අවම කිරීම සඳහා විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ අයදුම්පත් සහ ඇතුළත් වීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම.

- Z-score වෙනුවට විශ්වවිද්‍යාලවලට තෝරාගැනීම සඳහා විකල්ප, වඩාත් සාධාරණ නිර්ණායක සංවර්ධනය කිරීම.
- විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට පෙර අනිවාර්ය, එහෙත් ඇගයීමට ලක් නොකරන පදනමින් ඩිජිටල් ස්වරූපයෙන් ලබා දෙන, ප්‍රමිතියක් සහිත තොරතුරු තාක්ෂණය සහ ඉංග්‍රීසි භාෂා පාඨමාලා පැවැත්වීම.
- විශ්වවිද්‍යාලවල ශාස්ත්‍රීය කාලසටහන් සමකාලික කිරීම.

2. විශ්වවිද්‍යාල විසින් විෂයාන්තර අධ්‍යයන සහ ඉගෙනුම් මාර්ග පිරිනමන බව තහවුරු කිරීම.

- මූලික/ පදනම් විෂය නොවන විෂයයන් පොදු විෂය පැසකින් තෝරාගැනීමේ විකල්ප සැපයීම.
- මෙම විෂයයන් අනිවාර්ය සම්මාන අවශ්‍යතාවන්ගේ කොටසක් බව තහවුරු කිරීම.
- කර්මාන්ත ස්ථානගත කිරීම්/ සීමාවාසික පුහුණුවීම් සියලු උපාධි සඳහා සාමාන්‍ය ශ්‍රේණි ලකුණු සඳහා නොවන අනිවාර්ය පාඨමාලා බවට පත්කිරීම.

3. සියලු සිසුන් හට උපාධි මට්ටමේ සුදුසුකම් ලබාගැනීමේ අවස්ථාව තහවුරු කිරීම සඳහා උසස් අධ්‍යාපනික ආයතන යාවත්කාලීන කිරීම සහ (අවශ්‍ය නම්) ස්ථාපිත කිරීම.

- පිළිගත් විශ්වවිද්‍යාල සමග අනුබද්ධ විද්‍යායතන/ මණ්ඩප ස්ථාපිත කිරීමෙන් විශ්වවිද්‍යාලයට ඇතුළත් කරගැනීම් පුළුල් කිරීම.
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය පුළුල් කිරීමේ පහසුකම් සැපයීම සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
  - පාඨමාලාවන්ට වැඩි පිරිසකට සහභාගි විය හැකි ලෙස ප්‍රාදේශීයව සහ දිස්ත්‍රික් පුරා අධ්‍යයන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම් ඒ අතර, ඒවායේ ස්වාධීනත්වය සඳහා පහසුකම් සැපයීම.
  - රැකියා වෙත නම්නීකරණය කරන ලද සහ විවිධාංගීකරණය කරන ලද සුදුසුකම් සහ අත්දැකීම් සහිත සිසුන්ට යෝග්‍ය විෂයාන්තර සහ පීඨාන්තර වැඩසටහන් පිරිනැමීම.
- දැනට තිබෙන විශ්වවිද්‍යාලවල සහයෝගය ලබාගනිමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ අතථ්‍ය විශ්වවිද්‍යාලයක් (virtual university) ස්ථාපිත කිරීම.
- උපාධි පිරිනමන ආයතනයක් ලෙස හෙද විද්‍යාල උසස් කිරීම.
- ක්‍රීඩා වෙනුවෙන් වෙන් වූ උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීම.

4. ශිෂ්‍යයන්ගේ පර්යේෂණ හැකියාවන් දිරිගැන්වීම සහ සංවර්ධනය කිරීම.

- සියලු උපාධි වැඩසටහන්වලට ස්වාධීන අධ්‍යයන අවශ්‍ය වන පාඩම් මාලා ඇතුළත් කිරීම.
- තම පාඨමාලා කටයුතුවලදී සිසුන් පර්යේෂණ පත්‍රිකා ලිවීම හා ඉදිරිපත් කිරීම අනිවාර්ය අවශ්‍යතාවක් බවට පත්කිරීම.
- පීඨ/ විශ්වවිද්‍යාල තුළ ශාස්ත්‍රීය පර්යේෂණ සම්මන්ත්‍රණවලට සහභාගි වීම සඳහා සිසුන් වෙනුවෙන් අවස්ථා නිර්මාණය කිරීම.
- ස්වාධීන පර්යේෂණ වෙනුවෙන් ශිෂ්‍ය පර්යේෂණ ප්‍රතිපාදන සහ සම්මාන ලබා දීමේ ක්‍රමයක් නිර්මාණය කිරීම.
- බහු විෂයික පර්යේෂණ දිරිගැන්වීම.

5. ගෝලීය අධ්‍යාපනික භාවිතාවන් වෙත නිරාවරණය වැඩිදියුණු කිරීම.

- ලෝක මට්ටමේ විශ්වවිද්‍යාලවල සංවර්ධනය කරන ලද පාඨමාලා ශ්‍රී ලාංකික සිසුන්ට පිරිනැමීම සඳහා ජාත්‍යන්තර නියෝජිතායතන, විද්‍යායතන සහ Khan Academy, Coursera, edX, Udacity, Udemy වැනි පාඨමාලා සම්පාදකයන් සමග සාකච්ඡාවලට මුලපිරීම. ශ්‍රී ලාංකික ශාස්ත්‍රාලිකයන් විසින් සංවර්ධනය කරන ලද පාඨමාලා දේශීය සහ ගෝලීය පාඨක පිරිසකට හඳුන්වා දීම.
- සම්පත් දේශීය සංදර්භයට සහ තම විෂයමාලාවලට ගැලපෙන පරිදි වෙනස් කරගැනීම හා හැඩගස්වා ගැනීම සඳහා ශාස්ත්‍රාලිකයන්ට ඉඩ දීම පිණිස ජාතික විවෘත අධ්‍යාපනික සම්පත් ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම් මෙම කෝෂ්ඨාගාරය (repository) විසින් පුළුල් (මුදල් ගෙවා හෝ ලබා ගන්නා) ශිෂ්‍ය පිරිසක් වෙනුවෙන්වූ අන්තර්ජාල පාඨමාලා සඳහා පදනම නිර්මාණය කරනු ඇත.
- 2030 වර්ෂය වනවිට ආසියාවේ දැනුම් කේන්ද්‍රයක් බවට පත් කිරීම සඳහා වූ ඉලක්කයන් කරා යාම පිණිස ජාත්‍යන්තර සිසුන් මෙරටට ආකර්ෂණය කර ගැනීම උදෙසා ජාත්‍යන්තර කීර්තියට පත් විදේශ විශ්වවිද්‍යාල පහසුකම් දේශීයව පිහිටුවීම සඳහා විශේෂිත අධ්‍යාපන කලාපයක් / නගරයක් නිර්මාණය කිරීම නිර්දේශ කෙරේ. රජය ඒ වෙනුවෙන් මූලික පහසුකම්, අවශ්‍යතා සහ යටිතල පහසුකම් මෙන් ම ඉඩම් ද පිළිගත් නීත්‍යානුකූල ක්‍රම යටතේ ලබාදීම නිර්දේශ කෙරේ.
- විදේශ සිසුන් ආකර්ශනය කරගැනීම සඳහා 'ජාත්‍යන්තර ශිෂ්‍ය වීසා' ක්‍රමයක් සංවර්ධනය කිරීමල වැඩ කරමින් ඉගෙනීමේ පහසුකම් ක්‍රම නිර්මාණය කිරීම. ඒ අනුව, සිසුන් කර්මාන්තවල හා සේවා සපයන ආයතන වල සේවය කරමින් දේශීය ආර්ථිකයට දායක වීම සඳහා විශ්වවිද්‍යාලය සමග ගිවිස ගනු ඇත.



## හෙද අධ්‍යාපන අංශය

1. හෙද පුහුණුවෙහි පරිපාලනය හා අධීක්ෂණය ප්‍රතිසංස්කරණය කිරීම.

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ හෙද අධ්‍යාපනය සඳහා විශ්ව විද්‍යාලයක් පිහිටුවීම.
- සියලුම හෙද පුහුණු පාසල් යෝජිත විශ්ව විද්‍යාලයේ පීඨයක ලෙස පිහිටුවීම.
- විෂයමාලා සංවර්ධනය හා ඇගයීම සහතික කිරීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා කිරීම් නිදසුනක් ලෙස සංශෝධිත විශ්ව විද්‍යාල පනත අනුව පුහුණු මාලා සංවර්ධනය කිරීම.
- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පහත සඳහන් දෑ සඳහා අවශ්‍ය වේ:
  - යෝජිත ජාතික හෙද විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන හෙද උපාධි මාලා සඳහා ප්‍රමාණවත් උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් කිරීම.
  - සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ සේවා නියුක්තිය හා ස්ථානගත කිරීම සඳහා පොදු කුසලතා ලැයිස්තුවක් සක්‍රිය කිරීම සඳහා අවසාන පිටවීමේ විභාගය සඳහා පොදු අංගයක් සම්බන්ධීකරණය කිරීම.

2. හෙද පුහුණු පාසල් උපාධියකට සමාන සුදුසුකමක් ප්‍රදානය කිරීම.

3. හෙද අධ්‍යාපනය හා පිළිවෙත් නියාමනය කිරීම සඳහා ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ සඳහා පෙළඹවීම

- යෝජිත ජාතික හෙද විශ්ව විද්‍යාලයේ හෙද උපාධිධාරීන් ලියාපදිංචි කිරීම සඳහා SLNC (Sri Lanka Nursing Council) පනත සංශෝධනය කිරීම.
- සියළුම හෙද අධ්‍යාපන ආයතන සිය උපාධිධාරීන් හෝ රාජ්‍ය තාන්ත්‍රිකයින් පුහුණු කිරීම ලියාපදිංචි කිරීම සඳහා SLNC ආයතනය විසින් නියම කර ඇති රෙගුලාසි අනුකූල වන බවට සහතික වීම.
- ශ්‍රී ලංකා හෙද සභාව නැවත ස්ථාපිත කිරීම.

4. දැනටමත් සුදුසුකම් ලබා ඇති ලියාපදිංචි හෙදියන් සඳහා ක්‍රමවේදය වැඩිදියුණු කිරීම.

- දුරස්ථ ඉගෙනීම් සහිත ඉහළ මට්ටමේ උපාධි මාලාවක් නියම කිරීම.
- SLQF 6 මට්ටම අනුකූලව නව උපාධි මාලා ව්‍යුහයක් ස්ථාපිත කිරීම; වසර හතරක් සඳහා අවම බැර 120 ක්

5. සේවා පුහුණුව ස්ථාපිත කිරීම සහ ප්‍රධාන අංගයන් ලෙස සෑකසීම.

- සේවා පුහුණු වැඩසටහන් වලදී පෞද්ගලික අංශයේ සේවය කරන හෙදියන්ටත සැපයිය යුතුය.
- සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ පෞද්ගලික අංශයේ විශේෂිත ඒකකවල සේවය කරන හෙදියන් සඳහා සේවා වැඩසටහන් සෑකසීම.
- අදාළ වන විට සේවා පුහුණුව සඳහා දුරස්ථ ඉගෙනුම් ආකෘති ප්‍රවර්ධනය කළ යුතුය.
- සේවා පුහුණු වැඩසටහන් අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සමඟ සම්බන්ධ කළ හැකිය.
- සේවා පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට හෙද නිලධාරීන්ට පහසුකම් ලබා දීම (එනම් නිවාඩු සම්මන්ත්‍රණ ගාස්තු ආදිය).

6. අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය වැඩසටහන් මගින් සෞඛ්‍ය සේවා පද්ධතියේ වර්තමාන අවශ්‍යතා හා ඉල්ලීම් සංවිධාන කිරීම.

- 21 වන සියවසේ අභියෝගයන්ට මුහුණ දීම සඳහා සඳහා වර්තමාන අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය වැඩසටහන් සංශෝධනය කිරීම.
- ඇතුළත් කළ හැකි කාණ්ඩ : සායනික විශේෂතාව, පරිපාලන, අධ්‍යාපනික සෞඛ්‍ය තොරතුරු පද්ධති සහ පෞරුෂ සංවර්ධන වැඩසටහන් මෙන්ම ඔන්කොලොජි හෙද, ළමා හෙද, වකුගඩු හෙද, රෝග නිවාරණ හෙද, විවේචනාත්මක සත්කාර හෙද, හෘද හෙද, කම්පන සහ හදිසි හෙද හෙදියන්, මානසික සෞඛ්‍ය හෙද, හෙද පර්යේෂණ, වයෝවෘද්ධ හෙද, ප්‍රජා සෞඛ්‍ය හෙද හා හෙද පරිපාලනය.

7. NTSහි තාක්ෂණය භාවිතය විධිමත් කිරීම සහ ඩිජිටල් ඉගෙනුම් අවස්ථා සක්‍රීය කිරීම.

- පුහුණුව ලත් හෙදියන්ට පහසුකම් සැලසීම සඳහා අඛණ්ඩ වෘත්තීය පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම.
- සියලුම හෙද වෘත්තිකයන්ට පරතර ඉගෙනුම සහ ඩිජිටල් ඉගෙනුම් මෙවලම් සඳහා ප්‍රවේශය ලබා දීම.
- විද්‍යුත් ඉගෙනුම් ප්‍රවර්ධනය කිරීම.

8. හෙදියන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා අවස්ථා පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම්

- පශ්චාත් උපාධි සහතිකයක් ලබා දීම.
- පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ස්ථාපිත කිරීම, එමගින් හෙද සේවයේ නවීන ප්‍රවණතා වන පරාවර්තක පුහුණුව, සහයෝගී ඉගෙනීම සහ ක්‍රියාකාරකම් මත පදනම් වූ ඉගෙනීම් පිළිබඳ තොරතුරු සහ පුහුණුව ලබා ලබා දීම.
- හෙද හෝ මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති සුදුසුකම් ඇති කිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හෙද උපාධියක් පිහිටුවීම.

9. හෙද අධ්‍යාපනයක් හැදෑරීමට කැමති සිසුන් සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය සංශෝධනය කිරීම.

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් සම්මත ප්‍රවේශ නිර්ණායකයක් සංවර්ධනය කිරීම.

10. හෙද අධ්‍යාපනයේ වෙනස්කම් ප්‍රකාශ කිරීම සඳහා සන්නිවේදන උපාය මාර්ගයක් වර්ධනය කිරීම.

